**2023 ජනවාරි 10 වන දින මතුගම ප්‍රාදේශීය සභාවේ පැවති මාසික මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව**

**පැමිණි ධූරදාරීන්**

1. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
2. රණසිංහ ආරච්චිගේ දොන් ලලිත් රණසිංහ මහතා - ගරු උප සභාපති
3. ලලිත් නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. මද්දුමගේ දොන් අතුල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
7. කසුන් හිරෝෂණ මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
8. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
9. වික්‍රමආරච්චිගේ කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. ප්‍රේමරත්න නාකන්දල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. සීතා ඩයස් ජයසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. සූරිය ආරච්චිගේ සුජීව නිර්මාණ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
17. සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
18. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. අබ්දුල් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
20. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. මද්දගේ හින්ටන් ගුණසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
23. ධම්මික නිර්මාල් විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. නිලූකා දර්ශනී සිල්වා මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
25. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
27. සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
28. නිමාලක සුරංග විමලසූරිය මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
29. මොතිලාල් සාන්තප්‍රිය රණවීර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**නොපැමිණි ධූරදාරීන්**

01. ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
02. නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
03. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. සුරේෂ් දර්ශන ජයසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

**නිළධාරීන්**

01. කේ.ඩබ්ලිව්.සුනේත්‍රා කාරියවසම් මහත්මිය - ලේකම්
02. එම්.කේ.ඩී.සී.අවන්ති මෙනවිය - සංවර්ධන නිලධාරී(සභා -කටයුතු)

මෙදින පෙ.ව.10.00 ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වුහ.පළමු ව ආගම සිහි කිරීමෙන් අනතුරු ව ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයත්,නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරු ව න්‍යාය පත්‍රානුකූල ව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**01. 2022 .12.13 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සභා අනුමැතිය සලකා බැලීම :-**
ඉහත සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**02. ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ නිවේදන :- නැත.**

**03. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :-**

3.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය
3.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී.නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා
3.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා

**04. සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම් සහ පැමිණිලි සභාගත කිරීම :-**

4.1 බප/මතු රත්නාලෝක (අර්ධ රජයේ අනුමත) විදුහලේ ගාස්තු පිළිබඳ ව දන්වා යැවූ සන්දේශය සභාවට ඉදිරිපත් කරන ලදී.

4.2. වැලිමානාන සංඝස උඩ තියෙන මාර්ගය සභාවට පවරා ගෙන කටයුතු කරන මෙන් වන ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න:-**

5.1.1 2021 මාර්තු මස සිට 2022 මාර්තු දක්වා එක් එක් මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා ලබා ගත් දුරකථන ගාස්තු වාර ගණන කීයද?

5.1.2 දුරකථන ගාස්තු ලබා ගත් ගාස්තුව කීයද?

(යෝජනාව අප වෙත ලැබීමේ දී වූ ප්‍රමාද දෝශය හේතුවෙන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීමට කාලය ප්‍රමාණවත් නොවන නිසා මීළඟ සභාවට කල් තබන ලදී.)

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

6.1.1 යටතේ 2018.04.10 දින මහ සභාවේ 5.1.8 යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත් ව මා වෙත පැවරී ඇති බලතල අනුව 2022.11.01 දින සිට 2022.11.31 දින දක්වා කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**2022 නොවැම්බර් ගෙවීම් විස්තර**

| අනු අංකය | නම | වවුචර් අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|---|---|
| | **01/11/2022** | | | |
| 01 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 01 | පොදු ගබඩාව සඳහා ඉන්ධන ලබා ගැනිම | 257300.00 |
| 02 | ප්‍රාදේශිය ලේකම් මතුගම | 02 | ඕවිටිගල එගොඩවත්ත මාර්ගය පවරා ගැනීම ට රජයේ තක්සේරු මුදල් ප්‍රාදේශිය ලේකම් වෙත ගෙවීම | 322500.00 |
| | **02/11/2022** | | | |
| 03 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි | 03 | ඩුප්ලෝ යන්ත්‍රයට තීන්ත 03 මාස්ටර් රෝල් 02 මිලට ගැනීම. තීන්ත 8456 x 3 = 25368.00 මාස්ටර් රෝල් 45640 x 2 = 91280.00 | 116648.00 |
| | **03/11/2022** | | | |
| 04 | කළ්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 04 | කාර්යාල සඳහා ලිපිද්‍රව්‍ය මිලට ගැනීම | 29000.00 |
| 05 | කළ්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 05 | ගණක යන්ත්‍රයක් මිලට ගැනීම | 5000.00 |
| 06 | ගුණවර්ධන ගරාජ් | 06 | ABP 5527 ත්‍රීරෝද රථය සේවා කිරීම | 12350.00 |
| 07 | රූපසිරි ප්‍රනාන්දු | 07 | විශේෂ 5/2008 නඩුවට පෙනී සිටීම නීතිඥ ගාස්තු (2022.06.27 හා 2022.09.07) | 10000.00 |
| 08 | රූපසිරි ප්‍රනාන්දු | 08 | P 4872 නඩුවට පෙනී සිටීම නීතිඥ ගාස්තු (2022.08.12 හා 2022.09.16) | 10000.00 |
| 09 | රූපසිරි ප්‍රනාන්දු | 09 | L 3862 නඩුවට පෙනී සිටීම නීතිඥ ගාස්තු (2022.06.29 හා 2022.07.19) | 10000.00 |
| 10 | රූපසිරි ප්‍රනාන්දු | 10 | P 4975 නඩුවට පෙනී සිටීම නීතිඥ ගාස්තු (2022.07.14 හා 2022.07.28) | 10000.00 |
| 11 | රූපසිරි ප්‍රනාන්දු | 11 | L 3660 නඩුවට පෙනී සිටීම නීතිඥ ගාස්තු (2022.08.24 ) | 5000.00 |
| 12 | විජය නිව්ස්පේපර් ලිමිටඩ් | 12 | 2023 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම පුවත්පත් දැන්වීම් ගාස්තු | 85560.00 |
| 13 | ඒ.එම්.එච් සිල්වා | 13 | පරිගණක යන්ත්‍රයක් අළුත්වැඩියාව හා බැටරි 01 ක් මිලට ගැනීම | 6800.00 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | ගයාන් මදුරංග තෙවරප්පෙරුම | 14 | යටදොලවත්ත මහජන පුස්තකාලය 2022/09 පුවත්පත් බිල්පත් ගෙවීම | 11260.00 |
| 15 | ගයාන් මදුරංග තෙවරප්පෙරුම | 15 | හේනේගම මහජන පුස්තකාලය 2022/09 පුවත්පත් බිල්පත් ගෙවීම | 10380.00 |
| 16 | සඳුන් ටෙක්ස්ටයිල් | 16 | පොත් බැඳීම් කටයුතු කිරීම සඳහා පොප්ලීන් රෙදි යාර 20 මිලට ගැනීම | 5200.00 |
| 17 | කේ.කේ.ඊෂාන් ගයන්ත | 18 | LM 5610 ගාබේජ් කම්පැක්ටරයේ AC පද්ධතිය ගෑස් පිරවීම | 6500.00 |
| 18 | චමින්ද ටයර් හවුස් | 19 | සභාවේ වාහන සඳහා පැච් දැමීම හා ZA 0452 JCB යන්ත්‍රයට ටියුබ් 01 ක් මිලට ගැනීම පැච් දැමීම - ZA 0452 , RF 1056 | 15700.00 |
| 19 | නාමල් හාර්ඩ්වෙයාර් | 20 | ටෙන්ට් පුටු අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම | 7970.00 |
| 20 | ගයාන් මදුරංග තෙවරප්පෙරුම | 17 | නවුත්තුඩුව පුස්තකාලය 2022/09 පුවත්පත් බිල්පත් | 10380.00 |
| 21 | කළ්‍යාණි ඉලෙක්ට්‍රිකල් | 21 | ආදාහනාගාරයේ සවිකර ඇති සිවිලිං පංකා සඳහා රේසර් 10 ක් මිලදී ගැනීම හා KDK විදුලි පංකා 01 ක් මිලට ගැනීම | 46200.00 |
| 22 | කළ්‍යාණි ට්‍රේඩින් | 22 | ගල්මත්ත උපකාර්යාලයට ගණක යන්ත්‍ර 01 හා පොදු ගබඩාවට ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම | 33500.00 |
| 23 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 23 | ඉන්ධන බිල්පත් පියවීම ඇමුණුම 01 | 197650.00 |
| 24 | P.S.K සර්විස් සෙන්ටර් | 24 | PE 6914 කැබ් රථය සේවා කිරීම | 35185.00 |
| 25 | ගුණවර්ධන ගරාජ් | 25 | ABU 3966 ත්‍රීරෝද රථය මෝටරය හා බ්‍රෂ් සෙට් එක දැමීම | 2100.00 |
| 26 | ඒ.එම්.එච් සිල්වා | 26 | පරිගණක යන්ත්‍රයක් අළුත්වැඩියාව හා UPS කොටසට බැටරි 02 ක් මිලට ගැනීම | 24250.00 |
| 27 | විද්‍යාවිලාස මුද්‍රණ ශිල්පියෝ | 27 | පොල බදු එකතු කිරීම ලේඛණ 10 ක් මුද්‍රණය කිරීම | 10500.00 |
| 28 | එස් අතපත්තු | 28 | මීගම පුස්තකාලය සඳහා 5 m වයර් කෝඩ් 01 මිලට ගැනීම | 1995.00 |
| 29 | ඩී.කේ නිශාන්ත | 29 | ස්ටීල් වර්ගයේ තණකොල කපන මැෂින් 02 ක් අළුත්වැඩියාව | 72485.73 |

| | | | | |
|---|---|---|---|---|
| 30 | N.S නානායක්කාර | 30 | 1 1/2 කළුගල් 1.10 cube 13x 14300 (ආනන්ද මාවත,සුදර්ශන මාවත,බදුගම 01 මාවත) සංවර්ධනය කිරීම | 185900.00 |
| 31 | තිලිණ නුවන් මුණසිංහ | 31 | ZA 0452 JCB යන්ත්‍රයේ ඇස්ලේටරය හා රේඩියේටරය පද්ධතිය අළුත්වැඩියාව | 136700.00 |
| 32 | සාලිය මෝටර්ස් | 32 | LJ 9413 ටිපර් රථයේ ටිපර් ජැක් එක අළුත්වැඩියා කිරීම | 83700.00 |
| 33 | අයි.බී සුසන්ත | 33 | ZA 6204 බොබ්කැට් යන්ත්‍රය සඳහා 3/8 2 වයර් හෝස් එක දැමීම | 1700.00 |
| 34 | කේ.වී.ඩී චමිපික රවීන්ද්‍ර | 34 | LED PHILIPS බල්බ් 200 මිල දී ගැනීම 1650 x 200 =330000 | 330000.00 |
| 35 | කා.හා.නි හොරවල | 35 | 2022/09 සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය | 1000.00 |
| 36 | කා.හා.නි හොරවල | 36 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 2945.00 |
| 37 | මුදල් භාරකරු | 37 | මෙරිල් මුණසිංහ ඇතුළු 30 ක් සඳහා 2022/10 සභික ගමන් වියදම් ගෙවීම | 75000.00 |
| 38 | මුදල් භාරකරු | 38 | මෙරිල් මුණසිංහ ඇතුළු 32 ක් සඳහා 2022/11 සභික දීමනා ගෙවීම | 495000.00 |
| 39 | අරුණ බුද්ධික ජිනදාස | 39 | ZA 2657 ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගත් අත්තිකාරම් පියවීම | 8720.00 |
| | **04/11/2022** | | | |
| 40 | අර්ජුන කිරිඇල්ල (මුදල් භාරකරු) | 39 A | නොවැම්බර් මස සහා සංග්‍රහ අත්තිකාරම් ලබා ගැනීම | 20000.00 |
| 41 | M.W නානායක්කාර | 40 | ZA 2657 JCB යන්ත්‍රයට හයිඩ්‍රොලික් ඔයිල් ලීටර් 10 මිලදී ගැනීම | 12000.00 |
| | **08/11/2022** | | | |
| 42 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් | 41 | ආදාහනාගාරය සඳහා 37.5 kg ලාෆ් ගෑස් 16 ක් මිලදී ගැනිම.(17415 x 16 = 278640.00) | 278640.00 |
| 43 | ජයලත් එන්ටප්‍රයිසස් | 42 | පොදු ගබඩාව සඳහා ඉන්ධන ලබා ගැනිම(ඩීසල් ලීටර් 415 x 200 = 88000 පෙට්‍රල් ලීටර් 100 x 370 = 37000.00 | 120000.00 |
| 44 | මුදල් භාරකරු(සී/ස මතුගම වි.සේ.ස සමිතිය) | 43 | පොදු ගබඩාව සඳහා ඉන්ධන ලබා ගැනිම(ඩීසල් ලීටර් 415 x 40 = 16600.00 | 16600.00 |
| | **09/11/2022** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 45 | V .කපිලනාදන් | 44 | 2022/10/25 යටදොලවත්ත ක්‍රීඩාපිටිය වෙන්කිරීමේ තැන්පත් ආපසු ගෙවීම | 4000.00 |
| 46 | R.M.I චතුරංග | 45 | 2022/10/29 යටදොලවත්ත ක්‍රීඩාපිටිය වෙන්කිරීමේ තැන්පත් ආපසු ගෙවීම | 4000.00 |
| 47 | මුදල් භාරකරු | 46 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 8000.00 |
| 48 | හොරවල උපකාර්යාලය | 47 | 2022/10 දෛනික වැටුප් හොරවල උපකාර්යාලය | 66599.67 |
| 49 | හොරවල උපකාර්යාලය | 48 | 2022/10 ව්‍යාපෘති වැටුප් හොරවල උපකාර්යාලය | 198136.26 |
| 50 | වැලිපැන්න උපකාර්යාලය | 49 | 2022/10 දෛනික වැටුප් වැලිපැන්න උපකාර්යාලය | 79919.67 |
| 51 | වැලිපැන්න උපකාර්යාලය | 50 | 2022/10 ව්‍යාපෘති වැටුප් වැලිපැන්න උපකාර්යාලය | 98452.80 |
| 52 | මතුගම ප්‍රධාන කාර්යාලය | 51 | 2022/10 දෛනික වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 185712.52 |
| 53 | මතුගම ප්‍රධාන කාර්යාලය | 52 | 2022/10 ව්‍යාපෘති වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 348276.98 |
| 54 | මතුගම ප්‍රධාන කාර්යාලය | 53 | 2022/10 විෂබීජහරණ වැඩසටහනේ වැටුප් | 188290.98 |
| 55 | මතුගම ප්‍රධාන කාර්යාලය | 54 | 2022/10 ඩෙංගු මර්ධන වැඩසටහනේ වැටුප් | 246132.00 |
| | **10/11/2022** | | | |
| 56 | ගෑස්ටෙක් එනර්ජි ලංකා | 55 | ඉල්ලා ඇති ගෑස් සිලින්ඩර් 10 ක් සඳහා ගෙවූ මුදලට ප්‍රමාණවත් සිලින්ඩර් නොතිබූ බැවින් පසුව ඉතිරි මුදල් ගෙවා ගෑස් සිලින්ඩර් ලබා ගැනීම | 62972.00 |
| 57 | මුදල් භාරකරු | 56 | H.G.N තනූජා ඇතුළු 05 ක් සඳහා 2022 ඔක්තෝම්බර් රාජකාරී දීමනා | 650.00 |
| 58 | මුදල් භාරකරු | 57 | 2022/11 වැටුප් අත්තිකාරම් (හොරවල) | 1500.00 |
| 59 | මුදල් භාරකරු | 58 | 2022/11 වැටුප් අත්තිකාරම් (වැලිපැන්න) | 1000.00 |
| 60 | මුදල් භාරකරු | 59 | 2022/11 වැටුප් අත්තිකාරම් (මතුගම) | 14600.00 |
| | **11/11/2022** | | | |
| 61 | කේ.වී.ඩී චමිමික රවීන්ද්‍ර | 60 | LED PHILIPS 16 W බල්බ් 100 මිල දී ගැනීම 1650 x 100 =165000.00 | 165000.00 |
| | **14/11/2022** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 62 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 61 | පොදු ගබඩාව සඳහා ඩීසල් ලීටර් 480 ක් හා පෙට්‍රල් ලීටර් 100 ක් මිලට ගැනීම.430 x 480= 206400.00,370x 100 =37000 | 243400.00 |
| 63 | පී.එම් ප්‍රසන්න | 62 | පොදු වෙළඳපල කඩකාමර වහල අළුත්වැඩියාවට ලී මිලට ගැනීම 2''x2''x200'' 1''x2''x200'' | 13000.00 |
| 64 | ජෙනරල් ඇන්ඩ් මෝටර් ට්‍රේඩර්ස් | 63 | LM 5610 ගාබේජ් කම්පැක්ටරයේ 75 D 23k excide බැටරි 01 ක් මිලට ගැනිම | 46347.00 |
| 65 | ජෙනරල් ඇන්ඩ් මෝටර් ට්‍රේඩර්ස් | 64 | QQ 1984 ත්‍රී රෝද රථය සඳහා mk 12 x 35 බැටරි 01 ක් මිලට ගැනිම | 21300.00 |
| 66 | චමින්ද ටයර් හවුස් | 65 | වාහන 03 ක් සඳහා පැච් දැමීම ZA 2657,AAF 4210,YQ 6448 | 950.00 |
| 67 | සහකාර කළමණාකරු,ඉංජිනේරු (ශ්‍රී ලං.ගම) අළුත්ගම ඩිපෝව | 66 | සභාව සතු වාහන 25 තක්සේරු වර්තමාන වෙළඳපල වටිනාකම නිර්දේශ ලබා ගැනිම | 35000.00 |
| 68 | K.T.N මෝටර්ස් | 67 | කොම්පෝස්ට් අංගණයේ බ්‍රේල් යන්ත්‍රය RF CMF 8520 බෙල්ට් 02 ක් මිලට ගැනිම | 5960.00 |
| | **15/11/2022** | | | |
| 69 | ජයසිරි එන්ටර්ප්‍රයිසස් | 68 | ගල්මත්ත උපකාර්යාලයේ තණකොල කපන යන්ත්‍රය සඳහා බොබින් 02 බ්ලේඩ් 02 මිලදී ගැනීම | 3340.00 |
| 70 | මුදල් භාරකරු (ආර්.පී වරුණ ඉෂාන්ත) | 69 | 2022/10 සෞඛ්‍ය පරිපාලක නිවාඩු දින වැටුප් | 4973.33 |
| 71 | මුදල් භාරකරු (යූ.කේ.මුණසිංහ) | 70 | 2022/09/10 රාජකාරි ගමන් වියදම් | 2100.00 |
| 72 | මුදල් භාරකරු (ගයාමි ගුණතිලක) | 71 | 2022/09/10 රාජකාරි ගමන් වියදම් | 2100.00 |
| 73 | මුදල් භාරකරු (ගයාන් මදුසංක) | 72 | 2022/09/10 රාජකාරි ගමන් වියදම් | 2100.00 |
| 74 | අරුණ බුද්ධික ජිනදාස | 73 | වාහනවල ආදායම් බලපත්‍ර දුම් සහතික ලබා ගැනීම (QQ 1984, RY 2228,YQ 6448,LM 5610) | 11305.00 |
| 75 | චමින්ද ටයර් හවුස් | 74 | වාහන සඳහා පැච් දැමීම(LM 5610,QQ 1984,LL 7571) | 5800.00 |
| 76 | දීප්ති ප්‍රජා මණ්ඩලය දීයලගල | 75 | ඉදිගොඩතැන්න 02 පටුමග කොන්ක්‍රීට් කිරීම 10 % අතරදවුම් ගෙවීම | 16459.89 |

| | | | | |
|---|---|---|---|---|
| 77 | අනුරුද්ධ ඉන්ද්‍රජිත් | 76 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 9629.00 |
| 78 | එච්.එස් ඩිලාන් | 77 | ශ්‍රවනාගාර භාරකරු 2022/10 අතිකාල දීමනා | 7555.20 |
| 79 | බී.කේ සුරාජ් | 78 | රියදුරු 2022/10 අතිකාල දීමනා | 7880.80 |
| 80 | ඩිලාන් ගුණරත්න | 79 | සෞඛ්‍ය කම්කරු 2022/10 අතිකාල දීමනා | 7221.75 |
| 81 | ජයන්ත සිල්වා | 80 | ආදාහනාගාර ක්‍රියාකරු 2022/10 අතිකාල දීමනා | 9687.19 |
| 82 | එම්.කේ සමන් ජානක | 81 | රියදුරු 2022/10 අතිකාල දීමනා | 13586.30 |
| 83 | සංජය එරික් ලසන්ත | 82 | මුරකරු 2022/10 අතිකාල දීමනා | 11776.80 |
| 84 | ඊ.එම් නුවන් චතුරංග | 83 | මුරකරු 2022/10 අතිකාල දීමනා | 6516.36 |
| 85 | කේ.ඒ ලසන්ත කුමාර | 84 | දෛනික කම්කරු 2022/10 අතිකාල දීමනා | 3799.80 |
| 86 | චන්දන පුෂ්පකුමාර | 85 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 5777.40 |
| 87 | සී.පී. මුණසිංහ | 86 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 7777.77 |
| 88 | ජානක රුවන් දයාරත්න | 87 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 8088.36 |
| 89 | දමිත් මල්ලවආරච්චි | 88 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 4863.87 |
| 90 | එම්.ඒ සේනාරත්න | 89 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 9752.00 |
| 91 | දීප්ති රංගජීව | 90 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 9722.00 |
| 92 | එල්.ඒ ගාමිණී | 91 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 12751.85 |
| 93 | ඒ.කේ.කරුණාලාල් ඇපා | 92 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 9566.25 |
| 94 | ප්‍රගීත් ඉන්දික | 93 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 1388.88 |
| 95 | ජී.ඒ අජිත් | 94 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 1895.79 |
| 96 | ජෙ.ඩී ප්‍රභාත් කුමාර | 95 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 11221.20 |
| | **16/11/2022** | | | |
| 97 | කේ.වී අරුණ ශාන්ත | 96 | මුරකරු 2022/10 අතිකාල දීමනා | 7221.75 |
| 98 | NTS හාර්ඩ්වෙයාර් | 97 | පුස්වැල්තැන්න හරස් මාර්ගයේ සඳසිරිගම බෝක්කුව ඉදිකිරීමට 1 1/2 ගල් කියුබ් 03 ක් හා ලෑලි අඩි 40 ක් මිලට ගැනීම | 34780.00 |

| | | | | |
|---|---|---|---|---|
| 99 | දීප්ති ප්‍රජා මණ්ඩලය දියලගල | 98 | නාරව්ල සාරානන්ද මාවත 03 වන පටුමඟ කොන්ක්‍රීට් කිරීම10 % අතරුදවුම් ගෙවීම | 72324.71 |
| 100 | දීප්ති ප්‍රජා මණ්ඩලය දියලගල | 99 | ඉදිගොඩතැන්න 01 පටුමග 02 අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම 10 % අතරුදවුම් ගෙවීම | 22795.86 |
| 101 | අර්ජුන කිරිඇල්ල | 100 | කොම්පෝස්ට් අංගණය වෙත ලැබී ඇති කසල හැලීමේ යන්ත්‍රය අළුත්වැඩියා කිරීමේදී දැරීමට සිදු වන සුළු වියදම් සඳහා අත්තිකාරම් ලබා ගැනිම. | 15000.00 |
| 102 | කේ.කේ.ඩී.ආර් සංජීව | 101 | ගෙවතු වගා වැඩ සටහන සඳහා අවශ්‍ය පැළ බීජ හා පොහොර ලබා ගැනීම වෙනුවෙන් අත්තිකාරම් ලබා ගැනිම | 50000.00 |
| 103 | කා.හා.නි වැලිපැන්න | 102 | ගෙවතු වගාව පිලිබඳව දැනුවත් කිරීම සඳහා පැමිණි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්හට 2022.11.02 දින දිවා ආහාර ලබා දීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 900.00 |
| | **17/11/2022** | | | |
| 104 | පතිරණ ඉංජිනියර්ස් | 103 | කොම්පෝස්ට් අංගණයේ ඇති බ්‍රේල් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 30500.00 |
| 105 | ලංකා විදුලිබල මණ්ඩලය | 104 | සභාවට අයත් ආයතන 81 සඳහා 2022 සැප්තැම්බර් මස විදුලි බිල්පත් ගෙවීම. | 175228.63 |
| 106 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 105 | PE 6914 කැබ් රථයට 2022.10.31 හා 2022.11.03 ඩීසල් ලීටර් 100 ක් ලබා ගැනිම | 51000.00 |
| | **18/11/2022** | | | |
| 107 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 106 | සභාවේ රථ වාහන සඳහා ඉන්ධන මිලදි ගැනීම. ඇමුණුම 02 | 9250.00 |
| 108 | ප්‍රියන්ත ගටර්ස් | 107 | නවුත්තුඩුව සුහද ප්‍රජා මණ්ඩලය සඳහා ජී.අයි.බට සහ සෙවිලි තහඩු ලබා දීම වෙනුවෙන් ගෙවිම | 231450.00 |
| 109 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් | 108 | ආදාහනාගාරය සඳහා ලාෆ් ගෑස් සිලින්ඩර් 15 ක් මිලදී ගැනීම 17415x15 | 261225.00 |
| 110 | ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් | 109 | 2022 ජුනි මස නිවාඩු දින වැටුප් | 8674.00 |

| | | | | |
|---|---|---|---|---|
| 111 | ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් | 110 | 2023 ජූලි මස නිවාඩු දින වැටුප් | 10842.50 |
| 112 | ප්‍රියන්ත හරිස්චන්ද්‍ර | 111 | රාජකාරී ගමන් වියදම් | 595.00 |
| 113 | තිලිණ නුවන් මුණසිංහ | 112 | ZA 2657 JCB යන්ත්‍රයේ ට්‍රාන්ස්මිෂන් පද්ධතිය අළුත්වැඩියා කිරීම | 470250.00 |
| 114 | පී.එස්.කේ සර්විස් සෙන්ටර් | 113 | RF 1056 ට්‍රැක්ටරය සේවා කිරීම | 30150.00 |
| | **21/11/2022** | | | |
| 115 | රහුමා ස්ටෝර්ස් | 114 | මතුගම මහජන පුස්තකාලයට 2022.08 හා 09 මාස සඳහා පුවත්පත් සැපයීම | 3800.00 |
| 116 | ඒ.සී.එෆ් සහිරා | 115 | මීගම පුස්තකාලයට 2022 සැප්තැම්බර් මාසය සඳහා පුවත්පත් සැපයීම | 6580.00 |
| 117 | ඩී.සී සුරේෂ් ලක්මාල් | 116 | මතුගම මහජන පුස්තකාලයට 2022.08 හා 09 මාස සඳහා පුවත්පත් සැපයීම | 42560.00 |
| 118 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 117 | ඉන්ධන බිල්පත් පියවීම ඇමුණුම 03 | 121476.00 |
| 119 | තිලකරත්න ට්‍රේඩර්ස් | 118 | පුස්වැල්තැන්න හරස් මාර්ගයේ සඳසිරිගම බෝක්කුව ඉදිකිරීමට mm 10 කම්බි හා වැලි මිලදී ගැනීම කම්බි 15 x 1475 = 22125, වැලි කියුබ් 4x2750 = 103000.00 | 125125.00 |
| 120 | තිලකරත්න ට්‍රේඩර්ස් | 119 | පුස්වැල්තැන්න හරස් මාර්ගයේ සඳසිරිගම බෝක්කුව ඉදිකිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති කොට්ට 68 ක් මිලදි ගැනීම 68x2900=197200.00 | 197200.00 |
| 121 | HSM මෙටල් | 120 | ඉහත කර්මාන්තයට අවශ්‍ය 3/4 කළුගල් කියුබ් 03 ක් හා ABC ගල් කියුබ් 01 ක් මිලට ගැනීම. ගල් කියුබ් 3 x13000.00 = 45000.00, ABC ගල් කියුබ් 01x11500.00=11500.00 | 50500.00 |
| 122 | HSM මෙටල් | 121 | ඉහත කර්මාන්තයට අවශ්‍ය ABC ගල් කියුබ් 05 ක් මිලට ගැනීම | 57500.00 |
| 123 | කා.හා.නි වැලිපැන්න | 122 | ගෙවතු වගා තරඟ විනිශ්චය සඳහා පැමිණි නිලධාරීන් හට සංග්‍රහ කිරීම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම | 2480.00 |
| 124 | ආර්.ඒ.ඩී කුමුදු කුමාර | 123 | රාජකාරී ගමන් වියදම් | 700.00 |

| | | | | |
|---|---|---|---|---|
| 125 | ඩී.එල් ජයතුංග | 124 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 2578.95 |
| 126 | මිහිඳු වන්න කුමාර | 125 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 අතිකාල දීමනා | 5817.99 |
| 127 | සුසන්ත හෙට්ටිආරච්චි | 126 | සෞඛ්‍ය කම්කරු 2022/10 අතිකාල දීමනා | 6740.30 |
| 128 | සුමිත් කුමාර අතුකෝරාල | 127 | දෛනික රියදුරු 2022/10 අතිකාල දීමනා | 6376.51 |
| 129 | ටී.ඩී අජිත් කුමාර | 128 | දෛනික සෞඛ්‍ය කම්කරු 2022/10 අතිකාල දීමනා | 6966.30 |
| 130 | ඩී.එච් ජයන්ත | 129 | දෛනික සෞඛ්‍ය කම්කරු 2022/10 අතිකාල දීමනා | 6121.90 |
| 131 | එල්.එල්.ප්‍රදීප් රංගනාත් | 130 | දෛනික සෞඛ්‍ය කම්කරු 2022/10 අතිකාල දීමනා | 2955.40 |
| | **22/11/2022** | | | |
| 132 | අර්ජුන කිරිඇල්ල | 134 | 2023 අයවැය ඒකාබද්ධ සාකච්ඡාව සඳහා පැමිණි මන්ත්‍රීවරුන් හට සංග්‍රහ කිරීම සඳහා ද්‍රව්‍ය ලබා ගැනීම | 20000.00 |
| 133 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 135 | පොදු ගබඩාව සඳහා ඉන්ධන ලබා ගැනීම. පෙට්‍රල් ලීටර්100 x 370= 37000,ඩීසල් ලීටර් 400 x 430 = 172000 | 209000.00 |
| 134 | පී.කේ චමින්ද | 136 | මතුගම මහජන පිට්ටනිය සඳහා තැන්පත් කල මුදල් ආපසු ගෙවීම | 20000.00 |
| | **23/11/2022** | | | |
| 135 | ආර්.ඒ.ඩී  කුමාර | 137 | ආයුර්වේදය සඳහා බෙහෙත් රැගෙන ඒම වෙනුවෙන් ප්‍රවාහන කුලිය ගෙවීම | 15500.00 |
| | **24/11/2022** | | | |
| 136 | එන්.එස්. නානායක්කාර | 138 | බදුගම 1 වන මාවක - ආනන්ද මාවත හා සුදර්ශන මාවත අළුත්වැඩියාවට අවශ්‍ය ABC කියුබ් 3 ක් හා චිප්ස් කියුබ් 3 ක් ගැනීම. ABC කියුබ් 3 x 14300 = 42900.00, චිප්ස් 03 x 15400.00 = 46200.00 | 89100.00 |
| 137 | අර්ජුන කිරිඇල්ල | 139 | 2022 නොවැම්බර් මහ සභා සංග්‍රහ අත්තිකාරම් පියවීම | 18132.00 |
| 138 | එම්.ඩී විරාජ් කුමාර | 140 | මතුගම මහජන ක්‍රිඩා පිටිය වෙන් කිරීමේ තැන්පත් ආපසු ගෙවීම | 10000.00 |
| 139 | මුදල් භාරකරු | 141 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 24068.00 |

| | | | | |
|---|---|---|---|---|
| 140 | මතුගම වි.සේ.ස සමිතිය | 142 | ZA 0452 හා ZA 2657 JCB යන්ත්‍ර දෙක සඳහා ඩීසල් ලීටර් 120 ක් ලබා ගැනීම.430 x 120 = 51600 | 51600.00 |
| 141 | DPJ හෝල්ඩිංග්ස් | 143 | සභාවට නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීම | 133400.00 |
| | **25/11/2022** | | | |
| 142 | සභාපති අගලවත්ත ප්‍රාදේශිය සභාව | 144 | අගලවත්ත ප්‍රාදේශිය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලී පදනම මත ලබා ගැනීම. පැය 1 ක් සඳහා රු. 6000.00 | 17500.00 |
| 143 | සී/ස මතුගම වි.සේ.ස සමිතිය | 145 | ZA 0452 JCB යන්ත්‍රයට ඩීසල් ලීටර් 60 ක් මිලදී ගැනීම | 25800.00 |
| 144 | කේ.වී.සී චම්මික රවීන්ද්‍ර | 146 | සභාවට LED බල්බ් 230 ක් මිලදී ගැනීම 1650 x 230 = 379500 | 379500.00 |
| 145 | සී.පී. මුණසිංහ | 147 | හිඟ අතිකාල දීමනා ගෙවීම (වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10) | 2138.84 |
| 146 | ජේ.ඩී ප්‍රභාත් කුමාර | 148 | වැඩ ක්ෂේත්‍ර කම්කරු 2022/10 හිඟ අතිකාල දීමනා ගෙවීම | 5610.60 |
| 147 | නාරහා කොම්පියුටර් ෆෝම්ස් | 149 | තක්සේරු නිවේදන 10000 ක් මුද්‍රණය කිරීම 9.90 x 10000 =99000 | 99000.00 |
| | **28/11/2022** | | | |
| 148 | කේ.කේ.ඩී.ආර් සංජීව | 150 | ආහාර සුරක්ෂිත වැඩ සටහන යටතේ පෙර පාසල් පරිශ්‍රයන්හි වගා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 50000.00 |
| 149 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 151 | පොදු ගබඩාව සඳහා ඉන්ධන ලබා ගැනීම. පෙට්‍රල් ලීටර්80 x 370= 29600,ඩීසල් ලීටර් 200 x 430 = 86000 | 115600.00 |
| 150 | සී/ස මතුගම වි.සේ.ස සමිතිය | 152 | ZA 0452 JCB යන්ත්‍රයට ඩීසල් ලීටර් 100 ක් මිලදී ගැනීම | 43000.00 |
| 151 | එම්.ජේ.එන් මොහොමඩ් | 153 | ගැසට් නිවේදන භාෂා පරිවර්ථනය කිරීම සඳහා ගාස්තු ගෙවීම | 35627.50 |
| 152 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 154 | ඉන්ධන ලබා ගැනීම ඇමුණුම 04 | 135150.00 |
| 153 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 155 | ඉන්ධන ලබා ගැනීම ඇමුණුම 05 | 54190.00 |
| 154 | එන්.එම්.හෙට්ටිආරච්චි | 156 | සාරානන්ද මාවත පාලම් ඇදි අළුත්වැඩියා කිරීමට අදාල කුලිය ගෙවීම | 160000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 155 | ඩබ්.ඩී සුනිල් ශාන්ත | 157 | ආදායම් පරීක්ෂක 2022 ඔක්තෝම්බර් වැඩ බැලීමේ දීමනා | 4523.33 |
| 156 | කා.හා.නි වැලිපැන්න | 158 | සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය | 1000.00 |
| 157 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 159 | ඉන්ධන ලබා ගැනිම ඇමුණුම 06 | 64500.00 |
| | **29/11/2022** | | | |
| 158 | සභාපති මතුගම ප්‍රාදේශිය සභාව | 160 | 2022/02/19 දින සේවයේ යෙදී සිටියදී මිය ගිය එම්.ඩී සිරිල් යන අයගේ මරණ පාරිතෝෂික මුදලින් රජයට අයවිය යුතු මුදල් මහජන බැංකු ගිණුමට බැර කර ඇති අතර ඔහුගෙන් අයවිය යුතු ආපදා ණය මුදල ඉතිරි කොටස සේවක ණය ගිනුමට බැර කිරීම සඳහා ලබා ගැනීම | 155300.00 |
| 159 | එච්.පී.කේ.බී.ඩී.යූ.අල්විස් | 161 | ගල්මත්ත මහජන පුස්තකාලයේ පුවත්පත් ගාස්තු 2022 අගොස්තු,සැප්තැම්බර් | 25750.00 |
| 160 | අර්ජුන කිරිඇල්ල | 162 | 2022/11/30 පැවති මහ සභාව සඳහා සංග්‍රහ වියදම් අත්තිකාරම් ලබා ගැනිම. | 25000.00 |
| 161 | එස් .අතපත්තු | 163 | ප්‍රධාන කාර්යාලයේ මුරකරුවන් සඳහා LED විදුලි පන්දමක් ලබා දීම | 2295.00 |
| 162 | එස්. අතපත්තු | 164 | ආයුර්වේදය සඳහා 5 m වයර් කෝඩ් 01 ක් හා ප්ලග් ටෝප් 01 ක් මිලදි ගැනීම | 2275.00 |
| 163 | නිව් සඳරුවන් සේල් සෙන්ටර් | 165 | කාර්යාල පිරිසිදු කිරීම සඳහා මොබ් කොසු 10 ක් මිලදී ගැනිම | 5350.00 |
| 164 | | 166 | | |
| 165 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි | 167 | හේනේගම පුස්තකාලයේ ජායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම | 55843.01 |
| 166 | ඩී.සී සුරේෂ් ලක්මාල් | 168 | මතුගම මහජන පුස්තකාලයේ 2022 ඔක්තෝම්බර් මස පුවත්පත් ගාස්තු | 22830.00 |
| 167 | රහුමා ස්ටෝර්ස් | 169 | මතුගම මහජන පුස්තකාලයේ 2022 ඔක්තෝම්බර් මස පුවත්පත් ගාස්තු ගෙවීම | 2050.00 |
| 168 | චතුම් ඇඩ්වර්ටයිසින් | 170 | කියවීම් මාසය වෙනුවෙන් හා කාබනික පොහොර ප්‍රවර්ධනය සඳහා උප කාර්යාල 02 සඳහා බැනර් මුද්‍රණය කිරීම | 4200.00 |

| | | | | |
|---|---|---|---|---|
| 169 | එන්.ඩබ්.නානායක්කාර | 171 | කසල හැලීමේ යන්ත්‍රය සඳහා ග්‍රීස් හා ගියර් ඔයිල් මිලදී ගැනීම | 5400.00 |
| 170 | එන්.ඩබ්.නානායක්කාර | 172 | පොදු ගබඩාවට අවශ්‍ය ලිහිසි තෙල් මිලට ගැනීම. Ds 40 L 20x 1250= 25000,2 T 10 L x 1200= 12000 | 37000.00 |
| 171 | කළ්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 173 | ලීගල් ජායා පිටපත් කොල පැකට් 01 ක් හා Ax3 පැකට් 05 ක් මිලදී ගැනීම | 24950.00 |
| 172 | මතුගම ඒජන්සීස් | 174 | ඉන්ධන බිල්පත් පියවීම ඇමුණුම 07 | 434353.03 |
| 173 | ඉන්ෆොබිට් ලංකා | 175 | SLT රවුටරය සඳහා UPS 1 ක් මිලදී ගැනීම හා මවුස් 01 ක් මිලට ගැනීම | 16950.00 |
| 174 | නාමල් හාර්ඩ්වෙයාර් | 176 | ප්‍රධාන කාර්යාලයට 13 A ප්ලග් ටොප් 1ක් හා 13 A ප්ලග් බේස් 01 ක් ගැනීම | 1720.00 |
| 175 | නාමල් හාර්ඩ්වෙයාර් | 177 | ප්‍රධාන කාර්යාලයේ පරිගනක සඳහා විදුලි තත් ඇදීමට අවශ්‍ය උපකරණ ගැනීම | 2940.00 |
| 176 | නාමල් හාර්ඩ්වෙයාර් | 178 | කසල හැලීමේ යන්ත්‍රය අළුත්වැඩියාවට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනිම | 13200.00 |
| 177 | නාමල් හාර්ඩ්වෙයාර් | 179 | ළමා පුස්තකාල ගේට්ටුව ට ඉබි යතුරු මිලදී ගැනීම | 1850.00 |
| | **30/11/2022** | | | |
| 178 | අරුණ බුද්ධික ජිනදාස | 180 | YQ 6448,QQ 1984,RY 2228 ,LM 5610 වාහන සඳහා ලබා ගත් අත්තිකාරම් පියවිම | 11305.00 |
| 179 | අර්ජුන කිරිඇල්ල | 181 | 2022/11/22 දින අයවැය කෙටුම්පත් සාකච්ඡාව සඳහා ලබා ගත් අත්තිකාරම් පියවිම | 18958.00 |
| 180 | ලංකා පිරිවුම්හල යටදොලවත්ත | 182 | ඉන්ධන ලබා ගැනීම(LM 5610 ඩීසල් ලීටර් 100 x 430= 43000, PE 6914 සුපිරි ඩීසල් ලීටර් 50 x 510 = 25500 | 68500.00 |
| 181 | කේ.කේ.ඩී.ආර් සංජීව | 183 | 2022 සාහිත්‍ය උත්සවයේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 98500.00 |
| 182 | ඒ.පී.පී පුෂ්පකුමාරි | 184 | 2022 සාහිත්‍ය උත්සවයේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 24000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 183 | කේ.කේ.ඩී.ආර් සංජීව | 185 | පරිසර මිතුරෝ වැඩසටහනට සහභාගී වූ නිලධාරී මණ්ඩලයට උදෑසන තේ පැන් සංග්‍රහ ලබා දීම සඳහා දරණ ලද වියදම් ලබා ගැනීම | 2410.00 |
| 184 | මුදල් භාරකරු | 186 | මුද්දර ගාස්තු අග්‍රිමය ප්‍රතිපූර්ණය | 8000.00 |
| 185 | අරුණ රබර් කම්පැණි | 187 | සාරානන්ද මාවත පාලම් ඇන්දම හා ආදාහනාගාරයේ අළු ඉවත් කිරීමට කොකු සෑදීම සඳහා අවශ්‍ය යකඩ බට මිලදී ගැනීම. 1/4 පයිප්ප 4 x 11950.00 = 47800.00, 3/4 පයිප්ප 2x5850.00 = 11700.00 | 59500.00 |
| 186 | අරුණ රබර් කම්පැණි | 188 | සාරානන්ද මාවත පාලම් ඇන්ද සකස් කිරීමට අදාල යකඩ මිලදී ගැනීම සඳහා ගෙවීම | 107310.00 |
| 187 | පී.වී.කපිල | 189 | ඉහත පාලම් ඇන්දේ තීන්ත ආලේප කිරීමට තීන්ත මිලදී ගැනීම | 10500.00 |
| 188 | නාමල් හාර්ඩ්වෙයාර් | 190 | සාරානන්ද මාවත පාලම් ඇන්ද සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම | 28350.00 |
| 189 | ගුණවර්ධන ගරාජ් | 191 | QQ 1984 ත්‍රී රෝද රථයේ බ්‍රේක් පොම්පය සෑදීම | 400.00 |
| 190 | F A C ඉන්ඩස්ට්‍රීස් | 192 | ZA 0452 JCB යන්ත්‍රයේ දත් දමා පුපුරා ඇති බූම් එක පෑස්සීම. | 154500.00 |
| | **කර්මාන්ත** | | | |
| | **03/11/2022** | | | |
| 19 | දීයගලගල දීප්ති ප්‍රජා මණ්ඩලය | 31 | හීන් ඇල යාය පැතිබැම්ම සකස් කිරීම 10 % අතරැඳවුම් | 49821.37 |
| | **17/11/2022** | | | |
| 192 | ජිනසේන පුද්ගලික සමාගම | 32 | බෙලිත්තකන්ද ජල ව්‍යාපෘතිය සඳහා වතුර මෝටරයක් මිලට ගැනීම | 785795.00 |
| | **28/11/2022** | | | |
| 193 | කළමණාකරු සමෘද්ධි බැංකුව යටදොලවත්ත | 33 | හොරවල කාය වර්ධන මධ්‍යස්ථානය වැසිකිලි පද්ධතිය සෑදීම 10 % අතරැඳවුම් | 27150.50 |
| 194 | නවුත්තුඩුව නිරෝගී වැඩිහිටි සමිතිය | 34 | අළුත්ගම්ගොඩ පෙර පාසල වැසිකිලි පද්ධතිය සෑදීම 10 % අතරැඳවුම් | 74937.09 |
| 195 | එක්සත් ප්‍රජා මණ්ඩලය ලෙව්වන්දුව | 35 | මණ්ඩගලකන්ද ජල ව්‍යාපෘතියේ 10 % අතරැඳවුම් | 64890.00 |

| | | | | |
|---|---|---|---|---|
| 196 | එක්සත් ප්‍රජා මණ්ඩලය ලෙව්වන්දුව | 36 | ගල්මත්ත පොදු වෙළඳපල අළුත්වැඩියාව 10 % අතරැඳවුම් | 70160.75 |
| | **30/11/2022** | | | |
| 197 | ඇතුලත්මුදලිගම ප්‍රජා ජල ව්‍යාපෘතිය | 37 | මතුගම සති පොල භූමිය වැසිකිලි පද්ධතිය අළුත්වැඩියාව 10 % අතරැඳවුම් | 34606.92 |
| | **සේවක ණය** | | | |
| | **04/11/2022** | | | |
| 198 | එම්.ඒ .පී.එස්.කේ කුලරත්න | 73 | ආපදා ණය | 75997.00 |
| 199 | එම්.කේ.ඩී.සී අවන්ති කුමාරි | 74 | ආපදා ණය | 250000.00 |
| 200 | ආර්.එච්.ආර් පෙරේරා | 75 | ආපදා ණය | 250000.00 |
| 201 | එල්.ඒ ගාමිණි | 76 | ආපදා ණය | 94987.00 |
| 202 | යූ.එල්.ටී.ඒ ගුණසිංහ | 77 | ආපදා ණය | 250000.00 |
| 203 | පී.ඒ.ඩී.වී.සී ගුණතිලක | 78 | ආපදා ණය | 125004.00 |
| 204 | ඒ.ජානක රුවන් දයාරත්න | 79 | ආපදා ණය | 159567.00 |
| 205 | බී.රත්නසාරී පෙරේරා | 80 | ආපදා ණය | 121972.00 |
| 206 | ආර්.එඒ.ඩී.කුමුදු කුමාර | 81 | ආපදා ණය | 125004.00 |

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා :-**
ආවරණ අනුමැතියට යටත් ව කරන ලද ගෙවීම් පිළිබඳ ව මොනවා හරි තියෙනවා නම් අහන්න.

<u>**යෝජනාව**</u>

6.1.2 2022.12.12 වන දින අයවැය දෙවන වර සම්මත කර ගැනීමට පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

<u>**තීරණය**</u>

2022.12.12 වන දින අයවැය දෙවන වර සම්මත කර ගැනීමට පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.එම වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

<u>**යෝජනාව**</u>

6.1.3 2022.12.30 වන දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

<u>**තීරණය**</u>

2022.12.30 වන දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.එම වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**<u>යෝජනාව</u>**

6.1.4 පළාත් නිශ්චිත අරමුදල් යටතේ (2022) වැලිමානාන කුරුඳුවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම මේ වන විට සිදු කර ඇත.එම මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධන කටයුතු සිදු කළ යුතු බැවින් ඒ සඳහා අදාළ ව රු.1,000,000.00 . 00ක ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**<u>තීරණය</u>**

පළාත් නිශ්චිත අරමුදල් යටතේ (2022) වැලිමානාන කුරුඳුවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම මේ වන විට සිදු කර ඇත.එම මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධන කටයුතු සිදු කළ යුතු බැවින් ඒ සඳහා අදාළ ව රු.1,000,000.00 . 00ක ඇස්තමේන්තුව ගරු සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.එම වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**<u>යෝජනාව</u>**

6.1.5 පුස්සලමුල්ල පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා වන රු.520 000.00ක ඇස්තමේන්තු මුදල සහ ව්‍යාපෘති විස්තරය ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**<u>තීරණය</u>**

පුස්සලමුල්ල පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා වන රු.520 000.00ක ඇස්තමේන්තු මුදල සහ ව්‍යාපෘති විස්තරය ගරු සභාවේ අනුමැතිය සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.එම වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**<u>යෝජනාව</u>**

6.1.6 පෙර පාසැල්,කසළ කළමනාකරණ,ඩෙංගු ව්‍යාපෘති සේවකයින්ගේ වැඩ විස්තරය සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

- ***පෙර පාසැල් ගුරු හා පෙර පාසැල් ගුරු සහායිකා***

| | |
|---|---|
| දිප්පිට පෙර පාසැල | 2022 නොවැම්බර් |
| කොස්ගහකන්ද පෙර පාසැල | 2022 නොවැම්බර් |
| නාරවිල පෙර පාසැල | 2022 නොවැම්බර් |
| කෝපිවත්ත පෙර පාසැල | 2022 නොවැම්බර් |

- ***කසළ කළමනාකරණ හා විෂබීජහරණ ව්‍යාපෘති සේවක***
  2022 නොවැම්බර් සහ දෙසැම්බර්

- ***ඩෙංගු මර්ධන ව්‍යාපෘති සේවක***
  2022 නොවැම්බර් සහ දෙසැම්බර්

**<u>තීරණය</u>**

පෙර පාසැල්,කසළ කළමනාකරණ,ඩෙංගු ව්‍යාපෘති සේවකයින්ගේ වැඩ විස්තරය සඳහා සහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.එම වැඩ විස්තරය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**6.1.7 <u>යෝජනාව</u>**

පෙර පාසැල්,කසළ කළමනාකරණ,ඩෙංගු මර්ධන හා කොම්පෝස්ට් ව්‍යාපෘති සේවකයින් වෙත දැනට ගෙවන දෛනික වැටුප රු.950.00 දීමනාව රු.1250.00 දක්වා වැඩිකර ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

(1) මේ වන විට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් ව්‍යාපෘති සේවා කාලය දීර්ඝ කරනු ලබන කසළ කළමනාකරණ හා පෙර පාසැල් ගුරු ව්‍යාපෘති සේවකයින්ගේ 2023 ජනවාරි සිට මාස 6ක සේවා දීර්ඝ කිරීම අනුමත කර ගැනීමට සියලු ලිපි ලේඛන පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමුකර ඇත. ඊට අනුමැතිය ලබා ගැනීමේදී දෛනික වැටුප ලෙස ඇස්තමේන්තු කර ඇති මුදල රු.950.00 කි.එම මුදලද රු.1250.00 ක් ලෙස සංශෝධනය කර යැවීමට යෝජනා කිරීම.

(2) මතුගම ප්‍රාදේශීය සභාවේ දැනට මාස 06 ක සේවා කාලයක් සඳහා අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති පදනමින් සේවය කරනු ලබන බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සේවා කාලය දීර්ඝ කරනු ලබන

- ❖ ඩෙංගු මර්ධන ව්‍යාපෘති සේවකයින්
- ❖ කසළ කළමනාකරණ හා විෂබීජ හරණ ව්‍යාපෘති සේවකයින්
- ❖ පෙර පාසැල් ගුරු හා පෙර පාසැල් ගුරු සහායක සේවකයින්

  යන ව්‍යාපෘති වල දෛනික සේවයේ යෙදෙන අය වෙත දිනකට ගෙවනු ලබන රු 00 .950.ක දීමනාව මෙම කාල වකවානුව තුළ ඔවුන්ගේ ජීවිකාව සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින් 2023 ,වර්ෂයේ ජනවාරි සිට ඔවුන්ගේ වැටුප රජයේ වැටුප් ලබන්නන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනා ද ඇතුලත් කර රු 1250.00.ක් දක්වා වැටුප් වැඩිකර ගෙවීම සඳහා යෝජනා කිරීම .

(3) ඊට අමතරව මෙම සභාව මගින් මාස 03න් 03ට සේවය දීර්ඝ කරමින් සේවයේ යෙදෙන

- ❖ කොම්පෝස්ට් ව්‍යාපෘති සේවකයින්
- ❖ පෙර පාසැල් ගුරු හා සහායක ව්‍යාපෘති සේවකයින් ගේ

  දැනට මාස තුනෙන් තුනට සේවය දීර්ඝ කිරීම මාස 06 දක්වා දීර්ඝ කිරීම සහ ඔවුන්ගේ වැටුප ද 2023 වර්ෂයේ ජනවාරි සිට රජයේ වැටුප් ලබන්නන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනා ද ඇතුලත් කර රු 1250.00.ක් දක්වා වැටුප් වැඩිකර ගෙවීම සඳහා යෝජනා කිරීම.

**<u>තීරණය</u>**

ව්‍යාපෘති සේවකයින්ට දීමනා කිසිවක් ඇතුළත් නොකර එක් අයෙකුට රුපියල් 1500.00ක දෛනික වැටුපක් 2023 ජනවාරි මස සිට ගෙවීමට ගරු මන්ත්‍රීතුමන්ලා විසින් අදහස් ඉදිරිපත් වූ අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ සඳහා කිසිවෙකුගේ විරුද්ධත්වයක් නොමැති වූ බැවින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

මතුගම සභාව මඟින් සේවා කාලය දීර්ඝ කරන සේවකයින්ට ජනවාරි මස සිට මාස 06 ක කාල සීමාවකට සේවා කාලය දීර්ඝ කිරීමේ ගිවිසුම් අත්සන් කිරීමටත් තීරණය විය.එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ සඳහා කිසිවෙකුගේ විරුද්ධත්වයක් නොමැති වූ බැවින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සහා සම්මත විය.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ ගොනුව අපි බස්නාහිර පළාත් කොමසාරිස්වරයා වෙත යවලා තියෙනවා.මේ සඳහා හැමදාම අපි ඉදිරිපත් කරන දින 90ක සේවා කාලයෙන් පසු යවපු වාර්තාව තියෙනවා.එතකොට මේක දින 180 දක්වා දික් කරන්න පුළුවන්.මම ආණ්ඩුකාරතුමාව දැනුවත් කළා.අපි මේක කලේ සේවා කාලය පටන් ගෙන මාස තුනක් ගිවිසුම් ගත වුණාට පසුව මාස තුනෙන් තුනට මේක යැව්වා.දින 180ට දුන්නා කියලා කම්කරු නීතියට යටත් වෙන්නේ නැහැ.දින 180ට වැඩිය තිබුනොත් තමයි ප්‍රශ්නය වෙන්නේ.ඒ නිසා මම ආණ්ඩුකාරතුමාගේ වාචික උපදෙස් මත ලිපියක් යවලා තියෙනවා,දින 180 සේවය කළාට පසුව නැවත මේක ඉල්ලන්න කියලා.අපි මේක එකම ගණයට අරගෙන යවන්න ඕන.මේ වෙලාවේ මේ අයගේ වැටුප රුපියල් 950 ක් දක්වා වැඩි කරගන්න අනුමත කර ගත්තේත් බොහොම අමාරුවෙන්. අපිට වුණු අසාධාරණය පළාත් පාලන ඉතිහාසයේ කාටවත් වුණා කියලා හිතන්නේ නැහැ.මොකද වැඩක් කරන්න සේවකයෙක් ලබාගන්න විදියක් නැහැ.මේක ධනාත්මකව හිතන්න කියන එක අපි මේ අවස්ථාවේ කියනවා.ඒ වගේම මේ සභාව හරහා ඒ පිළිබඳ ව රාජ්‍ය තන්ත්‍රය දැනුවත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා**
අපි මේක රුපියල් 1500.00 කරමු.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
එහෙනම් අපි මේක රු.1500 කරලා යවමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
මේ යෝජනාව පිළිබඳව කතා කරන්න ඕන. මොකද විශේෂයෙන්ම අපේ ලේකම්තුමියට ස්තුතිවන්ත වෙනවා. එතුමිය කෙලින්ම කිව්වා මේක මාස හයක් දක්වා දීර්ඝ කරන්න පුළුවන් කියලා.මේකට අපට සහාය වීම පිළිබඳව ස්තුතිවන්ත වෙන්න ඕන.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපි යවලා තියෙන ව්‍යාපෘති වාර්තාවකටම දීමනාව වැඩි කරන්න එකතු  කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**
ඒ මුදල වැඩි කිරීම පිළිබඳව අපි ඔබතුමාට අපේ ප්‍රසාදය පළ කරනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මෙතන අවුරුදු දහයක් පමණ සේවය කරන අය ඉන්නවා.ඒ නිසා මම මේ කරුණට විශේෂ ස්තුතියක් පුදකරනවා. මෙවැනි ධනාත්මක සිතුවිල්ලක් ඇතිවීම පිළිබඳව මම ලේකම්තුමියට ස්තුතිවන්ත වෙන්න ඕන.මොකද මේ සේවකයෝ තමයි හැමදේම කරන්නේ.මම හිතෙනවා මේක සාර්ථක කරගන්න ලේකම්තුමිය කඩිනමින් කටයුතු කර කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**
මේ යෝජනාව මම දෙවතාවක්ම ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබුවා.දැන් මේක යථාර්ථයක් වෙමින් පැවතීම පිළිබඳව මම සතුටු වෙනවා.මේ සේවකයන්ට සභාවේ සිටින සියළුම මන්ත්‍රීවරු විශේෂ ස්තුතියක් පුද කරන්න ඕන.ගරු උප සභාපතිතුමා කිව්වා වගේ රුපියල් 950ට අවුරුදු දහයක් වැඩ කළ සේවකයොත් ඉන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා**
ඇත්තටම ඒ යෝජනාව පිළිබඳව ප්‍රසාදය පළ කරනවා.රුපියල් 950,රුපියල් 1250 කළොත් රුපියල් 300යි වැඩි වෙන්නේ.ඒක රුපියල් 1500 කළොත් රුපියල් 550ක් වැඩි වෙනවා.ඒ නිසා මේ මුදල රුපියල් 1500.00 කරන්න කියන ඉල්ලීම කරනවා.රුපියල් 1250.00 ක් කියන්නේ අද තියෙන ජීවන තත්ත්වය අනුව ඉතාම සුළු මුදලක්.සාමාන්‍ය කම්කරුවෙක් දවසකට සේවය කරන්නේ රුපියල් 2000 ක් වැනි මුදලකට.මේ 1250ක මුදල රුපියල් 1500ට යන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

මේක හොඳ යෝජනාවක්.සභාපතිතුමා,ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාටම අවංක ආදර ස්තූතිය මේ මොහොතේ පලකරනවා.අද වෙනකොට මේ ව්‍යාපෘති පදනම මත සේවය කරන සේවකයින්ගේ රුපියල් 950.00 ක දෛනික වැටුපට අවුරුදු දහයක් පමණ සේවය කරන සේවකයින් ඉන්නවා.ඒ නිසා මේ යෝජනාව ඉතාමත්ම කාලෝචිත යෝජනාවක් හැටියට ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම මේ මුදල රුපියල් 1500.00දක්වා වැඩි කළ හැකි නම් ඒ සඳහා සුදුසු පියවරක් ගන්න කියන ඉල්ලීම කරමින් නිහඬ වෙනවා.

**යෝජනාව**

6.1.8 පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීම සඳහා ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

1. මීගම පෙර පාසල ඉදිරිපස පියස්ස ඉදි කිරීම.
2. යටදොළ කොස්ගහකන්ද පෙර පාසලේ පියස්ස ඉදි කිරීම.
3. දිප්පිට පෙර පාසලේ ඉදිරිපස මායිම් වැට ඉදි කිරීම සහ ළමා මිදුල සකස් කිරීම.
4. වැලිපැන්න උප කාර්යාලය ඉදිරිපස පියස්ස ඉදි කිරීම.
5. මීගම පුස්තකාලය තීන්ත ආලේප කිරීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම.
6. වැලිපැන්න පොදු වෙළඳපළ සඳහා ජලය සැපයීම.
7. ශ්‍රවණාගාරය අළුත්වැඩියාව
8. ක්‍රීඩා පිටිය වැසි ජල කාණුව
9. වැලිපැන්න ක්‍රීඩා පිටිය දැල් වැට ඉදි කිරීම.
10. කොම්පෝස්ට් අංගනයේ වහල ප්‍රතිසංස්කරණය කිරීම.
11. යටදොළ උප කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.
12. යටදොළ සායනයට පිවිසෙන මාර්ගය සකස් කිරීම.
13. රථවාහන අංගනය අසල ඇති වැසි ජල ඇළ මාර්ග සංවර්ධනය කිරීම.
14. ශාන්තමේරි විදුහල අසල කුමාර වෙල්ගම මාර්ගයේ ආරක්ෂිත පැති බැම්ම ඉදි කිරීම.
15. නඩත්තු කටයුතු සිදු කරන මාර්ග සඳහා ද්‍රව්‍ය සැපයීම.
16. මීගම පුස්තකාලයට ජලය ලබා දීමට මාර්ගය හරහා ජල නල ස්ථාපිත කිරීම.

**තීරණය**

පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීම සඳහා ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

1. මීගම පෙර පාසල ඉදිරිපස පියස්ස ඉදි කිරීම.
2. යටදොළ කොස්ගහකන්ද පෙර පාසලේ පියස්ස ඉදි කිරීම.
3. දිප්පිට පෙර පාසලේ ඉදිරිපස මායිම් වැට ඉදි කිරීම සහ ළමා මිදුල සකස් කිරීම.
4. වැලිපැන්න උප කාර්යාලය ඉදිරිපස පියස්ස ඉදි කිරීම.
5. මීගම පුස්තකාලය තීන්ත ආලේප කිරීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම.
6. වැලිපැන්න පොදු වෙළඳපළ සඳහා ජලය සැපයීම.
7. ශ්‍රවණාගාරය අළුත්වැඩියාව
8. ක්‍රීඩා පිටිය වැසි ජල කාණුව
9. වැලිපැන්න ක්‍රීඩා පිටිය දැල් වැට ඉදි කිරීම.
10. කොම්පෝස්ට් අංගනයේ වහල ප්‍රතිසංස්කරණය කිරීම.
11. යටදොළ උප කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.

12. යටදොළ සායනයට පිවිසෙන මාර්ගය සකස් කිරීම.
13. රථවාහන අංගනය අසල ඇති වැසි ජල ඇළ මාර්ග සංවර්ධනය කිරීම.
14. ශාන්තමේරි විදුහල අසල කුමාර වෙල්ගම මාර්ගයේ ආරක්ෂිත පැති බැම්ම ඉදි කිරීම.
15. නඩත්තු කටයුතු සිදු කරන මාර්ග සඳහා ද්‍රව්‍ය සැපයීම.
16. මීගම පුස්තකාලයට ජලය ලබා දීමට මාර්ගය හරහා ජල නල ස්ථාපිත කිරීම.

යන මෙම ව්‍යාපෘති ඉටු කිරීමට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ගරු සභාවට ඉදිරිපත්කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

__යෝජනාව__

6.1.9 වැලිපැන්න උප කාර්යාලයේ සේවය කරන ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරු පී.එල්.චාතුර්යා සේනානි හට දරු ප්‍රසූතිය සිදු කළ ද මේ දක්වා වැටුපක් හිමි නොවන බැවින් ආර්ථික අපහසුතාවයන් හේතුවෙන් වැටුප හෝ දීමනාවක් ලබා දීමට කටයුතු කරන මෙන් ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

__තීරණය__

වැලිපැන්න උප කාර්යාලයේ සේවය කරන ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරු පී.එල්.චාතුර්යා සේනානි හට දරු ප්‍රසූතිය සිදු කළ ද මේ දක්වා වැටුපක් හිමි නොවන බැවින් ආර්ථික අපහසුතාවයන් හේතුවෙන් වැටුප හෝ දීමනාවක් ලබා දීමට කටයුතු කරන මෙන් ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

## 6.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා:-

__යෝජනාව__

6.2.1 මතුගම ප්‍රාදේශීය සභාව මඟින් දැනට මහජන ක්‍රීඩා පිටිය තුළ ඉදි කිරීමට යෝජිත නව ක්‍රීඩාගාරය සඳහා දයා ටී පැස්කුවල් ක්‍රීඩාගාරය නමින් නම් කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

__තීරණය__

මතුගම ප්‍රාදේශීය සභාව මඟින් දැනට මහජන ක්‍රීඩා පිටිය තුළ ඉදි කිරීමට යෝජිත නව ක්‍රීඩාගාරය සඳහා දයා ටී පැස්කුවල් ක්‍රීඩාගාරය නමින් නම් කරන ලෙස ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

මේ මහජන ක්‍රිඩාපිටිය මතුගම තියෙන පැරණි ක්‍රීඩා පිටියක්.නමුත් මෙහි ක්‍රීඩාගාරයක් නොමැති වීම විශාල අඩුවක්.ඒ සඳහා ක්‍රිඩා සමාජයක් ඉදිරිපත් වෙලා තියෙනවා,ඒ අයගේ දායකත්වයෙන් අපේ ප්‍රාදේශීය සභාවේ සම්පූර්ණ අයිතිය යටතේ මේ ක්‍රීඩාගාරය ඉදි කරන්න.ඊට පස්සේ මම ඔවුන්ගේ සමිති වාරයේදී මේ ක්‍රීඩාගාරය සඳහා "දයා ටී පැස්කුවල් "ක්‍රීඩාංගනය යනුවෙන් නම් කරන්න ඉල්ලුවා.ඒ අය ඒකට ඉතාම කැමැති වුණා.අපේ අයිතිය නිසා අපට මේ පිළිබඳ වැඩ කටයුතු කරන්න පුළුවන්.ඒ වුණත් ඒ අයත් මේ ක්‍රීඩාගාරය මේ නමින් නම් කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.ඒ නිසා මේක ඉතා ඉක්මනින් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා ගෙනාපු යෝජනාව හිටපු නියෝජ්‍ය ඇමතිතුමාගේ නමින් මෙම ක්‍රීඩාංගනය නම් කරන්නයි.එතුමා එසේ මෙසේ කෙනෙක් නෙවෙයි.මේ ප්‍රදේශයට විශාල සේවයක් කරපු කෙනෙක්.ඒ වගේම මේ නගර සීමාව දියුණු කරන්න බොහොම කැපවුණු කෙනෙක්.මේ යෝජනාව සඳහා අපේ සභාවේ සියලුම දෙනාගේ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.දයා ටී.පැස්කුවල් නියෝජ්‍ය ඇමතිතුමාගේ නම යෝජනා කිරීමත් මම හිතන්නේ අතුල මන්ත්‍රීතුමාගේ කෘතගුණ දැක්වීමක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී. මිත්‍රානන්ද මහතා**

අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා ගෙනාපු යෝජනාව 2023 වර්ෂයේ ගෙනා ඉතා වැදගත් යෝජනාවක්.ගරු කළ යුතු අයට ගරු කරන්න ඕන කියන පදනමේ තියෙන යෝජනාවක්.දයා ටී.පැස්කුවල් මහතා අවුරුදු විසි එකක් පමණ මේ සභාව නියෝජනය කරමින් මතුගම ජනතාවට විශාල සේවයක් කරපු මන්ත්‍රීවරයෙක්.සමූපකාර සේවය පිළිබඳව ගත්තොත් සියලුම පාරිභෝගිකයන්ට අවශ්‍ය කටයුතු එතුමා ඒ කාලයේ කළා.ඒ වන විට තිබුණු මතුගම සුළු නගර සභාවේ සේවකයෙක් හැටියටත් විශාල සේවයක් කළා.මතුගම ආසනය තුළ සියලුම දේවල් සංවර්ධනයට කැප වුණා.ඒ වගේම මතුගම ප්‍රාදේශීය සභාවක් වෙනකොට මතුගම නගරයක් හැටියට නගර සංවර්ධනයට ප්‍රධාන හේතුවක් වෙලා තියෙන්නේ එතුමාගේ ක්‍රියාකලාපය යි.එතුමා බලාපොරොත්තු වුණේ හොරවල ගම් සභාව නාගරික තත්ත්වයට පත් කරන්න.ඒ වගේම වැලිපැන්න ගම් සභාව සංවර්ධනය කරන්නත් එතුමා බලාපොරොත්තු වුණා.නගරයක් හැටියට මතුගම ප්‍රදේශයට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නයි එතුමා බලාපොරොත්තු වුණේ.ඒ නිසා මේ අවස්ථාවේ දයා ටී.පැස්කුවල් මැතිතුමාට අපේ ගෞරවය පුද කරන්න ඕන.එතුමාව සිහිකරලා එතුමා නමින් හොඳ ක්‍රීඩාගාරයක් හදලා එතුමා නමින් නම් කරන එක හොඳ දෙයක්.ඒ වෙනුවෙන් අනුග්‍රහය දක්වන එක හොඳ උපහාරයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

දයා ටී.පැස්කුවල් මහතා කියන්නේ මම හිතන්නේ මතුගම දේශපාලනයේ එක්තරා සංධිස්ථානයක්.අපි වගේ දේශපාලකයින්ට ඉගෙන ගන්න හොඳ පාසලක් වගේ කෙනෙක්.අපේ ගම්වල තිබුණු දේ වෙනුවට සංවර්ධනය වෙනුවෙන් අතිවිශාල සේවයක් කරලා දූෂිත දේශපාලනයෙන් තොරව අවංකව සේවය කළා නම් එතන ඉදිරියට තියෙන්නේ එතුමාගේ නමයි.ඒ නිසා මේ යෝජනාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතාට ස්තූතිය සහ ගෞරවය ප්‍රකාශ කරනවා.වලගෙදර ජාතික පාසල මෙතුමාගේ නමින් නම් කිරීමට මමත් උත්සාහ කළා.ඒ යෝජනාව තව ම යථාර්ථයක් බවට පත්වෙලා නැහැ.ඒ වෙනුවෙන් අපි කැප වෙලා වැඩ කරන්න ඕන.ඒ කෙසේ වෙතත් මතුගම නගරයට සංකේතයක් වුණු මෙතුමාගේ නාමය මතුගම නගරය තුළ මෙසේ දකින්න ලැබීම ඉතාම වටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් විජේසිංහ මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මහතා ගෙනාපු මේ යෝජනාව දයා ටී.පැස්කුවල් මැතිතුමාට කෘතගුණ සැලකීමක් වශයෙන් ඉතා හොඳ යෝජනාවක්.දයා ටී පැස්කුවල් හිටපු නියෝජ්‍ය ඇමතිතුමා ඉතාම ගුණවත් කෙනෙක් බව මම පෞද්ගලිකව දන්නවා.ඒ උතුම් ගුණයට අදටත් මම ගරු කරනවා.එවැනි ගුණගරුක චරිතයක් තියෙන කෙනෙකුගේ නම යොදන්න අතුල මන්ත්‍රීතුමා යෝජනා කළා නම් ඒක එතුමාගේත් තියෙන හොඳ ගුණයක්.ඒ නිසා මේ ගුණ දෙකම අපි හොඳින් අගය කරනවා.මේක එතුමාට කෘතගුණ දක්වන්න හොඳ අවස්ථාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

අතුල මන්ත්‍රිතුමා මේ යෝජනාව ගෙන ඒම කාලෝචිතයි.දේශපාලනික වශයෙන් ගත්තාම සමස්ත මතුගම ජනතාවට සහ කලුතර ජනතාවට විශාල සේවයක් කරපු නායකයෙක්.මේ ක්‍රීඩාගාරය සඳහා එතුමාගේ නම යෝජනා කළොත් පරම්පරා ගණනාවක් මේ නම තියෙයි.ඒකට හේතුව තමයි

අනාගතයේ ඉන්න දරුවෝ ටිකට මෙතුමා හොඳ දේශපාලන නායකත්වයක් දරපු කෙනෙක් කියලා දැනේවි.එ නිසා දයා ටී පැස්කුවල් මැතිතුමාගේ නම ඒ ක්‍රීඩාගාරයට යෝජනා කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

දයා ටී. පැස්කුවල් මැතිතුමා කියන්නේ ඇත්තටම මතුගම නගරය සංවර්ධනය වෙනුවෙන් විශාල සේවයක් කරපු මහත්මයෙක්.මෑත කාලයේ දී මේ සී.ටී.බී. බස් නැවතුම්පොළ පවා හදා දුන්නේ එතුමාගේ ඉල්ලීමට අනුව යි.ඒ වගේම මතුගම නගරයේ මහා මාර්ග,සමුපකාරය පවා එතුමාගේ උත්සාහයේ නිමවීම්.එවැනි විශාල සේවයක් කළා.එපමණක් නෙවෙයි මේ ක්‍රීඩා කරන ක්‍රීඩා පිටිය පවා එතුමාගේ නමින් නම් කරලා තියෙන්නේ.එ නිසා මම හිතනවා මේ අලුතින් හදන ක්‍රීඩාගාරයටත් එතුමාගේ නම යෙදීම කළගුණ සැලකීමක් වශයෙන් සුදුසුයි කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය**

හැමදාමත් හොඳ දෙයක් කරන පරිණත මන්ත්‍රීතුමෙක් විදිහට අතුල මන්ත්‍රීතුමා කළ මෙම යෝජනාව පිළිබඳව මම ඉතාම සන්තෝස වෙනවා.මොකද මම පුංචි කාලේ දයා ටී පැස්කුවල් මහතා පිළිබඳව හොඳින් අහලා තියෙනවා.එවන් මනුෂ්‍යත්වය පිරි උතුම් මිනිසෙකුට ගෞරවයක් විදිහට ඉතාම සුදුසු යෝජනාවක් මේක.මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දයා ටී පැස්කුවල් මැතිතුමා නමින් තමයි මතුගම ක්‍රීඩාංගනයත් නම් කරලා තියෙන්නේ.අපෙන් වෙන්න ඕන මේ ක්‍රීඩාංගනය සංවර්ධනය කරන එක.මතුගම සුදර්ශනාරාමයේ නායක ස්වාමීන් වහන්සේ මේ මතුගම ක්‍රීඩාංගනය දියුණු කරන්න කියලා අපෙන් ඉල්ලීමක් කළා. අපි ඒක ක්‍රමානුකූලව කරගෙන යනවා.මේ දයා ටී පැස්කුවල් මැතිතුමා අලුතින් පත්වන දේශපාලකයින්ට පවා ජනතාවට සේවය සැපයීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් දියුණු කරලා තියෙනවා.දයා ටී. පැස්කුවල් මන්ත්‍රීතුමාගේ ශ්‍රී නාමය හැමදාම මෙනෙහි කරන්න පුළුවන් තත්ත්වයට අපේ නගරවාසීන් පත්වෙලා ඉන්නවා.මේ යෝජනාව ක්‍රියාත්මක කරන්නම්.

**6.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත විජිත කුමාර මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

6.3.1 රාජ්‍ය පරිපාලන සේවයේ වසර 05 ඉක්මවූ නිලධාරීන් සභාවේ වෙනත් ස්ථානයකට හෝ වෙනත් ආයතනයකට ස්ථාන මාරු වීම් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

**ඉල්ලා අස්කර ගත් යෝජනාවකි.**

**6.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**<u>යෝජනාව</u>**

6.4.1 සෑම ග්‍රාම නිලධාරී වසමකටම අනුයුක්ත ව සේවය කරන රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් ප්‍රජාව සහභාගීත්වයෙන් ඒ ඒ ග්‍රාමසේවා වසම්වලට අනන්‍ය වූ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට ප්‍රාදේශීය සභාව මූල්කත්වය ගන්නා මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**<u>තීරණය</u>**

සෑම ග්‍රාම නිලධාරී වසමකටම අනුයුක්ත ව සේවය කරන රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් ප්‍රජාව සහභාගීත්වයෙන් ඒ ඒ ග්‍රාමසේවා වසම්වලට අනන්‍ය වූ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට ප්‍රාදේශීය සභාව මූල්කත්වය ගන්නා මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යෝජනා කරන ලද අතර මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය එරංග කරවිට මහතා**

මම මීට පෙරත් මේ හා සමාන යෝජනාවක් සභාවට ඉදිරිපත් කරනු ලැබුවා.අප රට පත්වෙලා තියෙන සමාජ සහ ආර්ථික තත්ත්වය මත මේ යෝජනාව ඉදිරිපත් කරනවා.සාමාන්‍යයෙන් ගමක රාජ්‍ය නිලධාරීන් ගණනාවක් සේවය කරනවා.ග්‍රාම නිලධාරී වසමකට රාජ්‍ය නිලධාරීන් පස් දෙනෙක් පමණ සේවය කරනවා.ඒ නිලධාරීන් බොහෝ අය තමන්ගේ රාජකාරිය කුමන ආකාරයෙන් ඉෂ්ට කළත් ගමක් තුළ නිලධාරීන්ගේ සන්නිවේදනයේ දුර්වලතා සහ එකතු නොවීම මත විශේෂ සංවර්ධන වැඩපිළිවෙළක් සිදුවෙන්නේ නැහැ.මම හිතන්නේ මේ රට ආර්ථික වශයෙන් අපහසුතාවයට පත්වෙලා තියෙන වෙලාවේ මේක හොඳ යෝජනාවක්.මතුගම ගත්තාම වගාව සඳහා යෝග්‍ය බිම් ප්‍රදේශයක් පවතින්නේ.මම හිතන්නේ සභාපතිතුමාගේ මූලිකත්වයෙන් සභාව මැදිහත් වෙලා මේ අවස්ථාවේ කුමන හෝ බෝගයක් වගා කිරීමට පෙළඹවීම සභාව මගින් කරන්න පුළුවන්.මේ කටයුත්තට සංවිධානාත්මකව දායක වෙන්න ඕන.මේ කටයුත්තට අපට සක්‍රිය දායකත්වයක් සපයන්න පුළුවන් නම් ඉතා වටිනවා.

**6.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා විසින් පසුවට කල් තබන ලද යෝජනා :-**

6.5.1 අප සභාව සතු අළුත්ගම්ගොඩ පොදු සුසාන භූමිය කිහිප වරක් ම අපි එක්සත් සුභසාධක සමිතිය මගින් ශ්‍රමදාන මට්ටමින් සුද්ද කර අතර නැවත ජනවාරි මාසයේ ශ්‍රමදානයක් සංවිධානය කර ඇත.එම කටයුත්ත සාර්ථක කර ගැනීමට සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය සහ තණකොළ කපන යන්ත්‍ර දෙකක් සහ කම්කරුවන් කිහිප දෙනෙකු ලබා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

6.5.2 එම සුසාන භූමිය අසල ඇති විදුලි කණුවට ලොකු විදුලි ලාම්පුවක් සවි කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**7. කාරක සභා වාර්තාව සලකා බැලීම.**

නැත.

**8. ආදායම් සහ වියදම් වාර්තා සලකා බැලීම.**

(2022 නොවැම්බර් මස ආදායම් සහ වියදම් වාර්තා සභාවේ දැන ගැනීම සඳහා සභාගත කරන ලදී.)ඇමුණුම 1

**9. පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා**

පළමුවෙන්ම ව්‍යාපෘති සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම පිළිබඳ ව ස්තූතිවන්ත වෙනවා.පෙර දින සභාවේ දී කිව්වා වගේ උමා ගාඩ්න් සංචාරක හෝටලයට යන මාර්ගය අබලන් වෙලා.මේක ප්‍රදේශයේ

ජනතාවට සුවිශේෂී සේවාවක් සැලසෙන ස්ථානයක්.මේ මාර්ගය සභාව යටතේ ප්‍රතිසංස්කරණය කරලා එල්.ඊ.ඩී බල්බ් එකක් යොදන්න.මොකද දැනට අපේ ප්‍රදේශයේ විශාල සේවකයෝ සංඛ්‍යාවක් සේවය කරනවා.මෙතනට විශාල සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණෙනවා.මේ පිළිබඳව තවම දැනුවත් වීමක් සිදුවෙලා නැහැ.නැවත වතාවක් මේ කාරණය ඉෂ්ට කරලා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මතුගම සිට පාන්තියට ගමන් කරන පල්ලිගොඩ මාර්ගය මේ වෙනකොට දිගටම කැඩිලා තියෙන්නේ.වර්ෂාව වෙලාවෙදි වාහන ගමන් කරලා මේ මාර්ගය හොඳටම අබලන් වෙලා තියෙනවා.මේ මාර්ගය පිළිබඳ ව සොයා බලලා ප්‍රතිසංස්කරණය කරලා ඇතුළු වෙන්න පුළුවන් දුර ප්‍රමාණය සටහන් කරලා දැන්වීමක් සඳහන් කරන්න.මේකේ බර ප්‍රමාණය සලකුණු කරලා බර වාහන ඇතුළු කරන එක නතර කරන්න සභාපතිතුමාට බලතල තියෙනවා.ඒ නිසා මේ මාර්ගය පිළිබඳව සොයා බලා කටයුතු කරන්න.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් විජේසිංහ මහතා**
751 මතුගම ග්‍රාම සේවා වසමේ ඇතුලත්මුදලිගම ආදගල මාර්ගය ගමන් කිරීමට නොහැකි තත්ත්වයට පත්වෙලා තියෙනවා.විශාල වශයෙන් මාර්ගය අබලන් වෙලා තියෙන නිසා ගමන් කිරීමට හැකි තත්වයට පත් කරන මෙන් ඉල්ලා සිටිනවා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
දේවාලකන්ද උගුල්වැටිකන්ද මාර්ගයට කාපට් අතුරා දෙන්න කියන ඉල්ලීමත් මේ අවස්ථාවේ දී කරනවා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලි ව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා**
අනතුරුදායක ගස් ඉවත් කිරීමේ දී මේ පැමිණිලි බොහොමයක් එන්නේ පෞද්ගලික ආරවුල් මුල්කරගෙන.මේ පිළිබඳව නිසි පරිදි සොයා බලා අනතුරුදායක ගස් ඉවත් කිරීම ක්‍රමවත්ව සිදු කරන්න හැකිනම් සභාව සහ නිලධාරීන් මේකෙන් අපහසුතාවයට පත් වෙන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය**
ආදගල පාරේ කෙනෙක් පුද්ගලික ඉඩමකින් ගහක් පාරට එනවා කියලා පාර අවහිරයි කියලා පැමිණිල්ලක් දාලා තියෙනවා.දැනට තුන්වෙනි ලියුමත් යොමු කරලා තියෙන්නේ.ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙලා නැහැ.

න්‍යාය පත්‍රානුකූල ව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසු මහ සභාවේ කටයුතු ප.ව.11.40 ට පමණ අවසන් විය.